# අනගාරික ධර්මපාලතුමා භාවිත කළ සන්නිවේදන ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක්.

**සමන් රාජපක්ෂ[1], අමාලි නන්දසිරි[2], කුසලා සජීවනී[3]**

*[1]ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*
*[2]සන්නිවේදන පර්යේෂණ ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*
*[3]සහකාර පුස්තකාලයාධිපති, ලේක් හවුස් පුස්තකාලය, ශ්‍රී ලංකාව.*
*[1*]saman.rajapaksha@ymail.com*

ආගමික ශාස්තෘවරුන්, දාර්ශනිකයින්, සමාජ ක්‍රියාකාරකයින් ස්වකීය දාර්ශනික මතවාද ප්‍රචලිත කිරීම පිණිස විවිධ සන්නිවේදන ක්‍රම භාවිත කර ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ අනාගාරික ධර්මපාලතුමා සිය දාර්ශනික මතවාද සමාජගත කිරීමෙහි ලා භාවිත කළ සන්නිවේදන ක්‍රමවේද පිළිබඳ විමසා බැලීමයි. එහිදී ප්‍රඥාවන්ත, දේශහිතෛෂි හා ශීලාචාර පුරවැසියෙකු බිහිකිරීමට ධර්මපාලතුමා අනුගමනය කළ සන්නිවේදන ක්‍රමවේද මොනවාද? යන්න විමසා බැලිණි. ධර්මපාලතුමා සිය මතවාද සමාජගත කිරීමට පුළුල් මානව විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක පදනමක් සහිත සන්නිවේදන පිළිවෙතක් අනුගමනය කෙරිණි යන්න අධ්‍යයනයේ උපන්‍යාසය වශයෙන් ගැනිණි. අන්තර්ගත විශ්ලේෂණය හා සිද්ධි අධ්‍යයනය ඔස්සේ ලබාගත් දත්ත ගුණාත්මකව ස්වයං විශ්ලේෂණයට බඳුන් කෙරිණි. අනගාරික ධර්මාපාලතුමා ප්‍රඥාවන්ත, දේශහිතෛෂි හා ශීලාචාර පුරවැසියෙකු බිහිකිරීම සඳහා චාරිකාවේ නියැලෙමින් සහභාගීත්ව සන්නිවේදනය ඔස්සේ ජනමතය සංවිධානය කළේය. සංස්කෘතික ආක්‍රමණයන්ට එරෙහිව ජනතාව පෙලඹවීම පිණිස සංවාද ක්‍රමය උපයෝගී කරගත්තේ ය. එතුමා සිය මතවාද සමාජගත කිරීමෙහි ලා භාවිත කළ සන්නිවේදන ක්‍රමවේදවල පුද්ගලයාගේ කායික මානසික චර්යා සහ ආචාර විද්‍යාත්මක ස්වභාවය අන්තර්ගතව පැවතුණි. අනගාරික ධර්මපාලතුමා දේශන පැවැත්වීමෙන්, තාර්කික කරුණු දක්වමින්, විමර්ශනාත්මක හා විශ්ලේෂණාත්මක කරුණු දක්වමින් ශ්‍රාවකයා දැනුවත් කළේ ය. එසේම එතුමා විවිධ ආචාර විද්‍යාත්මක නීති පනවමින්, ශ්‍රාවකයාට අපැහැදිලි තැන් පහදා දෙමින් බෞද්ධ දාර්ශනික පදනමක් ඔස්සේ සිය ප්‍රචාරණ ක්‍රියාදාමය සිදුකළේ ය. එහිදී ධර්මපාලතුමා සිය ධර්ම සන්නිවේදන පිළිවෙත පැවිදි උතුමන්, රාජ්‍යතාන්ත්‍රිකයින් වැනි සමාජ යාන්ත්‍රණ මූලයන් ඇසුරින් ක්‍රියාත්මක කර ඇත. මේ අනුව ධර්මපාලතුමා අනුගමනය කළ සන්නිවේදන පිළිවෙත පුළුල් මානව විද්‍යාත්මක හා සමාජ මනෝ විද්‍යාත්මක පදනමකින් සමන්විත වූවක් බව පෙන්වාදිය හැකි ය. එය අනගාරික ධර්මපාලතුමා විසින් සමාජයට සම්ප්‍රේෂණය කළ දාර්ශනික සංකල්ප සමාජයේ අඛණ්ඩව සංසරණයවීම සඳහා හේතු වී ඇත.

මුඛ්‍ය පද ඃ මතවාද, සන්නිවේදන ක්‍රමවේද, ශ්‍රාවකයා, සමාජ යාන්ත්‍රණ මූලයන්, සහභාගීත්ව සන්නිවේදනය